ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1828/3 - 2013 සැප්තැම්බර් මස 16 වැනි සඳුදා - 2013.09.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: පීජ්එස්සීඕ/එල්/3 /1

සංශෝධනයයි

අංක 1758/24 හා 2012.05.17 දිනැති *ගැසට්* නිවේදනයෙහි අංක 06/126 දරන දැන්වීම මගින් ප්‍රකාශිත අංක 01 දරන ඉඩම් කැබැල්ලෙහි විස්තරය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

1. කැබලි අංක : 01

ඉඩමේ නම: මීපිටියවත්ත; විස්තරය: ගෙවත්ත ; හිමිකම් කියන අය: රජය (මුල් හිමිකම්පාන්නා එල්. පී. මන්ජුලා පෙරේරා, මීපිටිය, නාවලපිටිය); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0597.

මධුපානි පියසේන,
ප්‍රාදේශීය ලේකම්,
පස්බාගේ කෝරළේ,
නාවලපිටිය.

2013 ජුනි මස 25 වැනි දින,
නාවලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 1144

**ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

යොමු අංකය: 3 /1/2/28
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී 05/2006/එච්ඩබ/425

2012 දෙසැම්බර් 18 වැනි දින අංක 1789/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III කොටසේ ඉඩම් යටතේ පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වගන්තිය යටතේ අංක 01-55 දැන්වීමෙහි අ.ග.පි. 1105 අතිරේකය 10 පත්‍රය 10 කැබලි අංක 187 සඳහා සඳහන් දිනය ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයක් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනය* | ඉවත් කළ දිනය *වෙනුවට* ආදේශ කළ යුතු දිනය |
|---|---|
| 2013.01.16 | 2013.10.07 |

ඊ.එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2013 ජුලි මස 08 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 1145

## ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

යොමු අංකය: 3 /1/2/29
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය– එල්ඩී 05/2006/එච්ඩබ්/62

2009 අප්‍රේල් 08 වැනි දින අංක 1596/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III කොටසේ ඉඩම් යටතේ පලකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වගන්තිය යටතේ අංක 04-577 දැන්වීමෙහි අ.ග.පි. 1106 අතිරේකය 13 පත්‍රය 12 කැබලි අංක 182 සඳහා සඳහන් දිනය ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයක් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළයුතු දිනය* | ඉවත් කළ දිනය *වෙනුවට ආදේශ* කළ යුතු දිනය |
|---|---|
| 2009.05.27 | 2013.10.30 |

ඊ.එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2013 ජූලි මස 07 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 1146

## ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: කැ.ප්‍රාලේ/අත්/3 /1/70

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

**අවශ්‍ය මහජන කාර්යය -**

කළුගහ ජල සම්පාදන ව්‍යාපෘතියේ 11 අදියර යටතේ ජල කුළුණක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම

**ලබා ගැනීමට ලබාපොරොත්තුවන ඉඩමේ විස්තර -**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 565 ඒ බටකැත්තර දකුණ ග්‍රාම නිළධාරි වසමේ මඩපාත ගමේ පිහිටි මූලික පිඹුරු අංක කො. 9331 හි සඳහන් කැබලි අංක 1

ඉඩමේ නම - සාරභූමි පෙදෙස : වරිපනම් අංක 43 A දරන
ඉඩම : විස්තරය : ගෙවත්ත, ස්ථිර ජල කුළුණක් ඇත. :
අයිතිය : රජය : මුල්හිමිකම් පාන්නා :
කැස්බෑව නගර සභාව
ප්‍රමාණය : හෙක්ටයාර් 0.0660

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2013.ඔක්තෝබර් මස 28 වැනි පූ. හා. 9.30 ට කැස්බෑව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013.ඔක්තෝබර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එල්. ඒ. කළුකපුආරච්චි,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කරගැනීමේ නිළධාරි,
කැස්බෑව කොට්ඨාසය.

2013 සැප්තැම්බර් මස 11 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

09 - 1251

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් විසින් අංක 1822/18 හා 2013.08.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ පළ කරන ලද නිවේදනයේ සිංහල පිටපතේ පිටු අංක 36 හි "ප්‍රාදේශීය ලේකම්, දෙහිවල සම්මුඛ විය යුතුයි" යන වගන්තිය "ප්‍රාදේශීය ලේකම්, කැස්බෑව සම්මුඛ විය යුතුයි" යනුවෙන් සංශෝධනය විය යුතු බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

එල්. ඒ. කළුකපුආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
කැස්බෑව.

2013 සැප්තැම්බර් මස 12 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 1156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.